# ජාතික කෞතුකාගාර පුස්තකාලයේ විද්‍යා ක්ෂේත්‍රයට අයත් පුස්කොළ පොත් පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලිය

එම්. බුලත්සිංහල
FGS/LISC/Mc/2009/011

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1193 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2014 දෙසැම්බර්

# සාරාංශය

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පුස්කොළ පොත් පිළිබඳව ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදීම ය. මෙහි දී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ නාමාවලී ගත නොවූ පුස්කොළ පොත් දහසකට අධික ප්‍රමාණයක් අතුරින් තෝරාගත් පුස්කොළ පොත් එකතු සියයක් වෙන් වෙන් වශයෙන් තෝරා ගෙන කර්තෘ, කාලය, ප්‍රකාශක, පිටපත්කරු, අන්තර්ගතය යනාදී ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ගැඹුරින් අධ්‍යයනය කිරීම සිදු විය. මේ අනුව අදාළ නියැදියෙන් පොදුවේ ජාතික කෞතුකාගාර පුස්කොළ පොත් එකතුවල ග්‍රන්ථ විද්‍යාත්මක තත්ත්වයන් පිළිබඳව සාධාරණීකරණයක් කළ හැකි යැයි අපේක්ෂා කැරිණි.

අධ්‍යයනයට භාජනය වූ එකතුවල අන්තර්ගත පුස්කොළ ග්‍රන්ථවල විවිධ විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමට අතිරේකව ඒවායේ ග්‍රන්ථ විද්‍යාත්මක ලක්ෂණ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යාව, එනම් ආයුර්වේදය, දේශීය වෛද්‍ය ග්‍රන්ථ, මානව රෝග චිකිත්සා, ඒ යටතේ විෂ වෙදකම, ඇස් වෙදකම, ගෙඩි වෙදකම, නාඩි ශාස්ත්‍රය, පශු වෙදකම, මන්ත්‍ර ශාස්ත්‍ර ඇතුළත් භූත විද්‍යාව, නක්ෂත්‍රය, ශාන්ති කර්ම යනාදී විෂයයන් දැක්විය හැකි ය. එමෙන්ම විවිධ රෝග ලක්ෂණ සහ දරු උපතට දෙන බෙහෙත්, ගර්භනීන්ට දෙන බෙහෙත් යනාදී ඖෂධීය ප්‍රතිකාර විධි සහ බෙහෙත් ඇතුළත් ය. එසේම මෙම විෂය ක්ෂේත්‍රයන් විද්‍යාත්මක පදනමක් මත බිහිවූ බව අධ්‍යයනය තුළින් පෙන්වා දී තිබේ.

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී සමහර පුස්කොළ පොත්වල නම සඳහන් නොවන අතර, සම්පාදක විසින් අන්තර්ගතය සළකා බලා නම කොටු වරහන් තුළ දක්වා තිබේ.

එමෙන්ම පුස්කොළ පොත් සහ ඒවායේ මුද්‍රිත ග්‍රන්ථ සමග සසඳා බැලීම පිළිබඳව වූ අධ්‍යයනයක් ද සිදු කොට තිබේ. මෙහි දී බොහොමයක් පුස්කොළ පොත් මුද්‍රිත කෘතීන් ලෙස ප්‍රකාශයට පත් වී ඇති බව අනාවරණය කර ගත හැකි විය.

මෙකී සියලු කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් අදාළ එකතු පිළිබඳ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කරන ලදී.

අධ්‍යයනයේ නිගමන වශයෙන් පැහැදිලි වූයේ, මෙරටට අනන්‍ය වූ පුස්කොළ ග්‍රන්ථ සම්ප්‍රදායක් තහවුරුව පැවති බවත්, විවිධ වූ විෂය ක්ෂේත්‍ර යටතේ පැවති මෙම පුස්කොළ පොත් විශේෂිත අක්ෂර රටා, අංකන රටා හා විද්‍යාත්මක පදනමකින් යුක්ත වූ බවත් මෙම අධ්‍යයනයේ දී හෙළි කර ගත හැකි විය. පොදුවේ සලකන විට ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ඇති මෙම පුස්කොළ පොත්වල අඩංගු විෂය කරුණු නූතන හා අනාගත පරපුරට ලබා දෙන්නේ කෙසේද යන වැඩ පිළිවෙලක අවශ්‍යතාවය මෙහි දී අවධාරණය කැරිණි.


මුඛ්‍ය පද - පුස්කොළ පොත්, ජාතික කෞතුකාගාර පුස්තකාලය, ග්‍රන්ථ නාමාවලී, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු, මුද්‍රිත පොත්

# Abstract

The aim of this research was to engage in a bibliographical study about the Ola leaf Manuscripts found in the National Museum Library. Here by out of the thousands of Ola leaf manuscripts that were not included in the bibliography of the National Museum library a collection of hundred were selected separately. They were studied deeply according to bibliographical information like author, time, and publisher, copy writed and content. According to this a generalisation of the conditions of the particular sample of the Ola leaf manuscripts found in the National Museum library was expected.

Special attention was paid for the bibliographical characteristics other than identifying the various subject areas of the collections of Ola leaf manuscripts that were take for the research. Indigenous medical science such as Indigenous medical books, Human disease therapy under that Visa Vedakam, As Vedakama, Gedi Vedakama, Nadi Sastraya, Pasu Vedakama, Ghost Science which includes science of charms, Naksastra, Ritual Blessings can be pointed out. Like wise various symptoms and medicine given at child birth, medicine given during pregnancy types of medical treatment and medicine is included. Accordingly through the study it is showed that these subject area was born on a scientific foundation.

When carrying out this study the names of some of the Ola leaf manuscripts were not mentioned. By taking the content into consideration the compiler has put the name in square brackets.

Accordingly a study has been carried out about the printed books of Ola leaf manuscripts. Here it was discovered that most of the Ola leaf manuscripts have been published as printed books.

Taking all these facts in to consideration an annotated bibliography including scientific information about the particular collections has been accomplished.

As the deduction of this study it is evident that there had been a tradition of Ola leaf manuscripts which was unique to our country. It was discovered that Ola leaf manuscripts which were under different subject areas consisted of special letter patterns, number patterns and a Scientific foundation the attention was paid to build up a programme to pass on the content of Ola leaf manuscripts found in the National Museum Library to present and future generation.

Key Words - Palm leaf Manuscripts, National Museum Library, Bibliography, Bibliographical Information, Printed Books.